**සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

**නිවාඩු කාලීන පැවරුම්**

**සිංහල - 9 ශ්‍රේණිය**

**නිවිතිගල අධ්‍යාපන කලාපය**

## ජනවාරි 1 සතිය

## 1 පාඩම - ශ්‍රී පාදය වැන්දවූ හැටි

❖ පාඩම හොඳින් කියවන්න.

1. සුදුසු වචන සොයා හිස්තැන් පුරවන්න.

① ...................... යනු ජනශ්‍රැතියේ එක් අංගයකි.

② ඉතිහාස ග්‍රන්ථවල ඇතුළත් නොවන ................. ජනශ්‍රැතියෙහි ගැබ් ව ඇත.

③ ජීවිතයේ විවිධ අවස්ථාවලදී ගැමි ජනයා හෙළූ ............... සහගත දෘෂ්ටිය ජනකතාවලින් නිරූපනය වේ.

(තොරතුරු,උපේක්ෂා,ජනකතා)

2. මෙහි එන කතාන්දරයට පසුබිම් වූ කොටගම නමැති ගම ගැන කෙටි විස්තරයක් ලියන්න.

3. 2 පිටුවේ 2 ඡේදය ඇසුරෙන් මෙම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

① ධනවත්කම නිසා මෙහි එන රදලවරයා ට ලැබුණු නම කුමක් ද?

② මෙහි එන සිටු දියණියගේ ලක්ෂණ 2ක් ලියන්න.

③ මහලු සිටු යුවලගේ වියෝවෙන් පසු සිදු වූ සිද්ධි අනුපිළිවෙළින් ලියන්න.

4. 3 වන ඡේදයේ සඳහන් පරිදි මහලු බවට පත් සිටු දියණියගේ ඉටු නොවූ පැතුම කුමක් ද?

5. මහලු සිටු දියණියගේ කතාව ඇසූ පුතුන් තිදෙනාගේ ප්‍රකාශ සඳහන් කරන්න.

6. මහලු මවගේ පැතුම ඉටු වුවත් ඇය ශෝකයෙන් පසු වීමට හේතුව කුමක් ද?

7. ශ්‍රී පාද ස්ථානයට යන ගමනේදී ඔවුන්ට හමුවූ ස්ථාන පිළිවෙළින් සඳහන් කරන්න.

8. මහලු මවගේ පැතුම ඉටුවූවත් ඇය ශෝකයෙන් පසුවීමට හේතුව කුමක් ද?

9. ‘‘බාල පුතු යුතුකම් දන්නා උණුවන හදවතක් ඇත්තෙකි’’ යන්නට කරුණු දක්වන්න.

10. බාල පුතු වෙනුවෙන් මහලු මව කළ ප්‍රාර්ථනය කුමක් ද?

11. ගැළපෙන ලෙස යා කරන්න.

| | |
|---|---|
| 1. නිරායාසයෙන් | මාසය |
| 2. ව්‍යවහාර | නෙළුම |
| 3. පද්මය | ඉබේ |
| 4. මහ | භාවිතය |
| 5. ප්‍රාකාරය | තාප්පය |

12. ‘‘දෙමව්පියන්ට සළකමු’’ මාතෘකාවට රචනාවක් ලියන්න.